# පුළුල් ජාතික ව්‍යාපාරයක අවශ්‍යතාවය

ශ්‍රී ල නි පක්‍ෂ නායකත්වය හා ජ. වි. පෙ. අතර සංධානය ගොඩ නොනැඟීමට ප්‍රධාන හේතු වුයේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ප්‍රතිපත්තිය. ඈ ශ්‍රී. ල. නි. ප. නායිකාව වුවද ඇගේ ප්‍රතිපත්ති මහජන පක්‍ෂයේ ප්‍රතිපත්ති වෙයි. මේ හේතුවෙන් ඇයට බලපෑම් දැමීමට විජාතික බලවේගවලට හැකිය. විජාතික බලවේග යනු විදේශීය තානාපතිවරු ආදීහු පමණක් නොවෙති. බොහෝ ක්‍රිස්තියානි හා කතෝලික නායක පූජකවරු රාජ්‍ය නොවන සංවිධාන ආදිය ද විජාතික බලවේගවලට අයත් වෙති. එහෙත් අද සිංහලයන් විශාල පිරිසකට පළල් ජාතික ව්‍යාපාරයක් අවශ්‍ය වෙයි. එම ජාතික ව්‍යාපාරයට ශ්‍රී. ල. නි. පක්‍ෂයේ බොහෝ දෙනකුට ද අවශ්‍ය වෙයි. නායකයන් කිහිප දෙනෙකු විජාතික බලවේගවල ගොදුරු බවට පත්වී තිබුණද ශ්‍රී ල නි පක්‍ෂය යනු 1955 පමණ සිට සිංහලත්වයේ පක්‍ෂය වෙයි. මේ පක්‍ෂයේ යම් පිරිසකගේ සහභාගිත්වය ජාතික ව්‍යාපාරයකට අත්‍යවශ්‍ය වෙයි. නායකත්වයේ කිහිප දෙනකු කුමක් කීව ද කුමක් කළ ද ශ්‍රී ල නි පක්‍ෂයට ජාතික ව්‍යාපාරයෙන් ඉවත් වී සිටිය හැකි නොවේ.

ජාතික ව්‍යාපාරයක් ගොඩ නැඟීමට විවිධ පුද්ගලයන් විවිධ කාලවල මහන්සි වී ඇත. අනගාරික ධර්මපාල තුමන්ගේ කාලයේ ද ඒ සම්බන්ධයෙන් යම් යම් උත්සාහයන් ගැනිණි. එහෙත් විවිධ හේතු නිසා ඒ සියල්ල එතරම් සාර්ථක වූයේ නැත. ධර්මපාල තුමා ගැන මෙරට විජාතික බලවේග කතාකරන්නේ විජාතිකයන්ට අවශ්‍ය අන්දමටය. ඔවුන්ට අවශ්‍ය සිංහලත්වයට පහර ගැසීම මිස අනෙකක් නොවේ. ධර්මපාල තුමාට පමණක් නොව නුවර පෙරහරේ අලි ඇතුන් ගෙනයෑමට බිබීසියේ අගු පිළේ වැතිරෙන සංදේශය නම් කුලී සේවය පහර ගසා ඇත. එංගලන්තයේ අශ්ව රේස් පැවැත්වීම නරි දඩයම ඊනියා විද්‍යා පරීක්‍ෂණවලට සතුන් යොදා ගනිමින් මරා දැමීම, සත්වෝද්‍යාන පවත්වාගෙන යෑම ආදිය ගැන වචනයක්වත් කතා නොකරන කුලී සංදේශ සේවය ඊනියා සත්ත්ව කරුණාවක් ලෙස නුවර පෙරහරේ අලි ඇතුන් ගෙන යෑම ගැන කතා කරයි. මෙය කාලෝ ෆොන්සේකා මහතා ගිනි පෑගීම ගැන කතාකළාට දෙවැනි නොවේ. ගිනි පෑගීම ආදිය ගැන කතා කිරීමට පළමුව ෆොන්සේකා මහතාට කතෝලික පල්ලිය තුළ සිදුවන ඊනියා මිත්‍යා ගැන කතා කිරීමට තිබුණි. එයට හේතුව ඒ මහතා කතෝලික දෙමවුපියන්ගේ දරුවකු ලෙස සහ ශාන්ත ජෝසප් විද්‍යාලයේ ශිල්ප හැදෑරුවකු ලෙස ඒ සංස්කෘතිය ගැන දැන සිටීමය එහෙත් අද වන තුරු ඒ මහතා අන්ධ පුද්ගලයන්ට පෙනීම ලබා දෙන්නන් ගැන බිහිරි අයට ඇසෙන්නට සලස්සන්නවුන් ගැන බටහිර වෛද්‍යවරයකු වශයෙන් කිසිවක් නොකියයි. ගණනාත් ඔබේසේකර මහතා සිංහල වෙද මහතකුගේ පුතකු වුවද ලබාගත් අධ්‍යාපනයෙන් සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි වෙයි. ඔහු අඩු වයසින් පිරිමි ළමුන් මහණ කිරීම ගැන කතා කරන්නේ ඒ පිරිමි ළමුන්ගේ ඊනියා මානව අයිතිවාසිකම් රැකීමට නොව (මානව අයිතිවාසිකම් යනු බටහිර ක්‍රිස්තියානි මානව අයිතිවාසිකම් වෙයි.) එසේ මහණ කිරීමට විරුද්ධව ප්‍රචාරය කර හැකිනම් ළමුන් මහණ කිරීම නතර කර එමගින් ශාසනය නැති කර දැමීමටය. කුලී සංදේශයට අවශ්‍ය නුවර පෙරහර නැතිකර දැමීම මිස අනෙකක් නොවේ.

බිබීසිය යනු එංගලන්තයේ අවශ්‍ය නම් බ්‍රිතානියේ, ඉංග්‍රීසි ක්‍රිස්තියානි සංස්කෘතිය හා එහි ආධිපත්‍ය ලෝකය පුරා පැතිරවීමට යොදා ගන්නා ප්‍රධානම අවියක් වෙයි. මොවුන් සංදේශය වැනි කුලී සේවාවන් කුලිය ගෙවා පවත්වාගෙන යන්නේ ඊනියා සිංහල ශ්‍රාවකයන්ට ඇති අනුකම්පාවක් කරුණාවක් නිසා නොව සිංහලයන් අතර තව තවත් ඉංගිරිසි ක්‍රිස්තියානි සංස්කෘතිය පැතිරවීමටය. ඔවුහු ඒ ඔස්සේ උපැවිදි වුවන් පැරැණි මාක්ස්වාදීන් ආදී කුලී කරුවන් යොදා ගනිමින් මේ කුලී සේවය සිංහලත්වය දුර්වල කිරීම පරම පවිත්‍ර චේතනාවෙන් කසිකබල් අදහස් සිංහලයන්ට ඇසීමට සලස්වති. අද මෙරට ජාතික ව්‍යාපාරයක් අවශ්‍ය වී ඇත්තේ මේ සියල්ලන්ම පරාජය කිරීමටය. මොවුන් පරාජය කිරීම දිවයින පුවත්පතට පමණක් තනිවම කළ හැකි දෙයක් නොවේ. ඉතා අවාසනාවන්ත සිද්ධියක් මේ පුවත්පතෙහිම ලිවීමට සිදුවීම ගැන මම බෙහෙවින් කණගාටුවෙමි. මා මෙය ලියන්නේ මින් පසු මෙවැනි සිද්ධි සිදුවීම වැළැක්වීමට පමණය. මේ සිද්ධියෙන් ද පැහැදිලි වන්නේ මෙරට ක්‍රිස්තියානි සංස්කෘතික බලවේග කිසි දිනෙකට වඩා අද ශක්තිමත් බවය. මා සඳහන් කරන්නේ අපවත්වී වදාළ නිල නොලත් සංඝරාජ හිමියන් ලෙස බොහෝ දෙනා හඳුන්වන මඩිහේ පඤ්ඤාසීහ මහානාහිමිපාණන්ගේ ආදාහන පූජාවේ දී සිදුවූ කරුණක් ගැනය. මා දන්නා තරමින් මෙරට භික්‍ෂූන් වහන්සේගේ නොව ගිහි බෞද්ධයකුගේ ආදාහනයක දී වුවද ගීත ප්‍රචාරය නොකෙරෙයි. මේ සම්බන්ධයෙන් මගේ පළමු අත්දැකීම මට ලැබුණේ එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ආදාහනේදීය. මෙය තවත් ක්‍රිස්තියානි සංස්කෘතිකාංගයකි. මේ අවමංගලයේ දී සිදුවූ ගී ගැයීමේ ක්‍රියාව මහානාහිමියන්ගේ ආදාහන පූජාවේදී ද සිදු කෙරිණි. මෙය කෙසේ න්‍යාය

© Prof. Nalin De Silva

පත්‍රයට ඇතුල් වුවා දැයි මම නොදනිමි. එහෙත් විජාතික බලවේගවල න්‍යාය පත්‍රයෙහි නම් මෙරට සිංහලත්වය නැති කර ඒ මත බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියක් ගොඩ නැගීමේ වුමනාව වෙයි. මහා නාහිමිපාණන් වහන්සේගේ ආදාහන පූජාවේ දී ගී ගැයීමට යොදා ගෙන තිබුණේ අමරදේව මහතාය. මේ අමරදේව මහතා ටික කලකට ඉහතදී මහ සඟ ගණ කර ඇත්තේ කුමක් දැයි චෝදනාකාරීව ඇසූ පන්ඩිත් අමරදේවමය. මම මහරගම ශ්‍රී පඤ්ඤාසාර ආයතනයට බෙහෙවින් ගරු කරමි. එමෙන්ම එහි වැඩ වසන අභිනව අනුනායක හිමිපාණන් වහන්සේට ද ගරු කරමි. එහෙත් ඉහත සඳහන් දෙය නොකියාම බැරි හෙයින් හා මේ ප්‍රවනතාවය ඉක්මනින්ම නැති කිරීමේ අවශ්‍යතාවය ඇති බැවින් එසේ ප්‍රකාශ කිරීමට සිදුවිය.

මහා නාහිමිපාණන් වහන්සේ වැඩ විසූ සමයේ උන්වහන්සේට ජාතිවාදී චෝදනාව එල්ල කළවුන් ම අද උන්වහන්සේ සියලු ලාංකිකයන්ගේ හිත සුව පිණිස වැඩ කළ උත්තමයකු ලෙස හැඳින්වීමට පෙරට පැමිණ ඇත. මා හිතන්නේ විජාතික බලවේග තවත් පාඩමක් අලුතින් ඉගෙන ඇති බවය. මේ පාඩම අනුව මොවුන් මහා නාහිමිපාණන් වහන්සේ සිංහල බෞද්ධයන්ට අහිමි කරනු ඇත. උන්වහන්සේගේ අපවත් වීමෙන් පසුව මේ බලවේග ක්‍රියාත්මක වී ඇති ආකාරය අනුව එවැනි නිගමනයකට පැමිණිය හැකිය. උන්වහන්සේ ජාතිවාදියකු ලෙස හැඳින්වූ පිරිස් මෙතරම් ඉක්මණින් තම චෝදනාව ඉවත් කර ගෙන ඇත්තේ හුදු මනුස්සකමට යැයි කිව හැක්කේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයෙහි තරම නොදත්තවුන්ට පමණය. මේ බලවේග ධර්මපාලතුමා මිය යෑමෙන් පසුව ද එතුමාට පහර දුන්හ. එහි ප්‍රතිඵලයක් වූයේ ධර්මපාල තුමාගේ නාමය තව තවත් ශක්තිමත් වීම පමණය. අද ජාතිය අවදි කරන්නේ ධර්මපාලතුමාගේ නමින්ය. ඉන් පාඩමක් ඉගෙන ඇති විජාතික බලවේග මඩිහේ පඤ්ඤාසීහ මහා නාහිමි නාමයට එවැනි ශක්තියක් ලබා නොදීමට ඉටාගෙන ඇති බව පෙනේ. අද උන්වහන්සේගේ නාමය ජනතාකරණයකට ලක් කර ශ්‍රී නාමයෙහි අගය නැති කර දැමීමට විජාතික බලවේග ක්‍රියා කරගෙන යයි. අපි මේ වෑයමට කෙලින්ම විරුද්ධ වෙමු. ඩී. බී. ජයතිලක මහතා ඇතුළු අයගේ ද බණ්ඩාරනායක මහතා වැන්නන්ගේ ද සමරු දේශන පැවැත්වීමට ජයදේව උයන්ගොඩ වැන්නන්ට ද ආරාධනා කෙරෙන රටක මහා නාහිමි සමරු දේශන සඳහා බුද්ධාගම පාවාදීම ලියූ තම්බයියා වැන්නන්ට ආරාධනා කිරීමට ඉඩ ඇත.

උතුරු හා නැගෙනහිර පළාත් සිංහලයන්ට අහිමි කිරීමට ප්‍රභාකරන් හා අනෙක් දෙමළ ජාතිවාදීන් ක්‍රියා කරද්දී අනෙක් පැත්තෙන් ඒ පළාත්වල ද වෙනත් පළාත්වල ද පුරා වස්තු සහ ඓතිහාසික වැදගත්කමකින් යුක්ත ස්ථාන ගොඩනැගිලි ආදිය සිංහලයන්ට අහිමි කිරීමට කටයුතු කෙරෙයි. මෙරට ඇති අනන්‍ය සංස්කෘතිය සිංහල බෞද්ධයන්ගේ නිර්මාණයකි. විජාතික බලවේගවලට අවශ්‍ය වී ඇත්තේ මේ සංස්කෘතික උරුමය සිංහලයන්ට පමණක් නොව මෙරට වැසි සියලු දේශප්‍රේමීන්ට නැති කිරීමටය. සීගිරිය විනාශ කිරීමට නෝර්වේ ජාතිකයන් දෙදෙනකුගේ යෝජනාවක් මත අරඅදින්නේ ඒ සඳහාය. ඒ අතර ඔවුහු තවත් දෙයක් එමගින් ඉටු කර ගනිති. අද බොහෝ දෙනා සිංහල, දෙමළ, මුස්ලිම් සමානත්වයක් ගැන කතා කරති. මෙහි වරදක් නැත. එහෙත් මේ සමානත්වය යන වචනය වග විභාගයක් නැතිව යොදා ගැනීම වරදකි. මේ සම්බන්ධයෙන් බොහෝ කරුණු මින් ඉහත විටින් විට කියා ඇති නමුදු මෙහිදීද. ඒ අවධාරණය කිරීම අවශ්‍ය වෙයි. සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ ආදීන් මෙරට සමාන වන්නේ පුද්ගලයන් ලෙසය. රැකියාවක් තනතුරක් හෝ වෙනත් යමක් ලබාදීමේ දී පුද්ගලයකුගේ ජාතිය, ජන වර්ගය ආගම ආදිය සැලකිය යුතු නොවේ. මේ මූල ධර්මය අද ක්‍රියාත්මක නොවන්නේ නම් ඒ සිංහල බෞද්ධයනට සාධාරණය ඉටු නොවන ආකාරයකිනි. උදාහරණයක් ලෙස ගතහොත් මෙරට අධ්‍යයන පීඨවලට ඇතුළත් කිරීමේ දී සිංහලයන්ට අසාධාරණයක් සිදු වෙයි. එබැවින් සිංහල දෙමළ මුස්ලිම් සමානත්වය ඉල්ලා සිටීම සිංහලයන්ට ද වැඩ දායකය.

එහෙත් මෙහි තවත් පැත්තක් ද වෙයි. ඒ සිංහල දෙමළ මුස්ලිම් ආදී සංස්කෘති සම්බන්ධයෙනි. ලෝකයේ කිසිම රටක ඒ රටේ වසන සියළු ජනවර්ගවල සංස්කෘති සමාන නොකෙරෙයි. ඒ ඒ රටේ ඓතිහාසිකව හා වෙනත් කරුණුවලින් විශේෂත්වයක් ලැබෙන සංස්කෘතියක් වෙයි. ඒ ඒ රටේ අනන්‍ය සංස්කෘතියක් ගොඩ නැගූ ජනවර්ගයේ හෝ ජාතියේ හෝ සංස්කෘතිය අනෙක් සංස්කෘති සමග සමාන නොකෙරෙයි. උදාහරණයක් ලෙස ගතහොත් බ්‍රිතානියේ ඇංග්ලෝ සැක්සන් ඉංගිරිසි සංස්කෘතියට හිමි තැන වෙනත් කිසිම සංස්කෘතියකට නොලැබෙයි. පසුගියදා ඊනියා නම්බු නාමයකින් පුදන ලද බ්‍රිතානියේ වැඩ වසන භිකෂුන් වහන්සේ එලිසබෙත් වින්ඩ්සර් මහත්මියගෙන් එය ලබා ගත්තේ ක්‍රිස්තියානි සංස්කෘතිය තුළය. එලිසබෙත් නෝනා ඒ භිකෂුන් වහන්සේ අසුනක වඩා සිටුවා උන්වහන්සේ වෙත පැමිණ වැඳ නමස්කාර කර ඒ ඊනියා නම්බු නාමය ප්‍රදානය කළා නොවේ. (මේ නම්බු නාම ලංකාවෙහි ප්‍රදානය කිරීම

© Prof. Nalin De Silva

බණ්ඩාරනායක මහතා විසින් නවතා දමන ලදී.) උන්වහන්සේට ශාලාවේ (බකින්හැම් මාලිගයේ යැයි සිතමි) එක් කොණක සිට එලිසබෙත් නෝනා කරා ඇවිද ගෙන ඒමට සිදු වුයේ ඇය එංගලන්ත ක්‍රිස්තියානි පල්ලියේ ද නායිකාව බව සිහි ගන්වමිනි. උන්වහන්සේ එසේ ශාලාවේ ඇවිද ගෙන එන විට ඒ ශාලාවේ සිටි එකදු අයකුවත් ආසනවලින් නැගිට්ටා නොවේ. උන්වහන්සේට ඒ ඊනියා නම්බු නාමය වෙනුවෙන් එලිසබෙත් නෝනා බුද්ධ චීවරයෙහි පදක්මක් පැළඳුවාය. ඒ පදක්කම ධර්ම චක්‍රය ඇසුරෙන් නිර්මාණය කරන ලද්දක් නොව කුරුසිය පදනම් කරගෙන නිර්මාණය කරන ලද්දකි. ඒ උත්සවවල දී ඒ රටේ ජාතික ගීය ගායනා කරන්නේදැයි නොදනිමි. එසේ ගායනා කරන්නේ නම් අප භික්ෂුන් වහන්සේට ද දෙවියෝ (තිස් තුන් කෝටියක් දෙවි දේවතාවුන් නොව යොහෝවා දෙවියන්ය.) රැජින රකිත්වා යන ගීය ගයද්දී නැගිට සිටීමට සිදු වන්නට ඇත.

මෙ කරුණු මෙහි දී සඳහන් කෙරුණේ එංගලන්තයේ විශේෂිත සංස්කෘතිය ගැන කීමටය. අප රටේ ද විශේෂිත සංස්කෘතියක් ඇත. ඒ සිංහල බෞද්ධ සංස්කෘතියයි සිංහල, දෙමළ මුස්ලිම් සමානත්වයක මුවාවෙන් මේ විශේෂත්වය නැති කිරීමට ඉඩ දිය යුතු නොවේ. අද විජාතික බලවේගවලට අවශ්‍ය වන්නේ ඊනියා සමානත්ව ගැන කතා කරමින් සිංහලයන් ගොනාට අන්දමින් මේ සංස්කෘතික විශේෂත්වය ද නැති කර දැමීමටය. ඔවුන් මිථ්‍යා ඉතිහාස ගොඩනගන්නේ ද ඒ සඳහාය. අප මේ ලණු ගිලිය යුතු නොවේ. සමානත්වය ගැන කතා කිරීමේදී පුද්ගල සමානත්වය ගැන කතා කිරීමට ප්‍රවේසම් විය යුතුය. එමෙන්ම විජාතික රූපවාහිනිය ද ඇතුළු ජනමාධ්‍ය හරහා කෙරෙන සංස්කෘතික සංහාරයද මේ විශේෂිත සංස්කෘතිය නැති කිරීම සඳහාය.

මෙයට අමතරව අද රට විදේශිකයන්ට විකිණෙයි. රක්ෂණය වැනි ආයතන පමණක් නොව ඉඩම් විකිණෙයි. අද විදේශිකයෝ රටේ ඉඩම් බුරුත පිටින් මිල දී ගනිති. විදේශිකයන්ට ඉඩම් විකිණීම සඳහා සහන රැසක් සලසා දී ඇත. ශක්තිමත් ජාතික ව්‍යාපාරයක් අවශ්‍ය වන්නේ ප්‍රභාකරන් පැරදවීමට පමණක් නොව ඉහත සඳහන් ව්‍යාපෘති ද පැරදවීමටය. කෙටියෙන් කිවහොත් ඒකීය රට, ස්වාධීනත්වය, ඉතිහාසය, ජාතික සම්පත්, විනාශ කරන සංස්කෘතිය පමණක් නොව බිම ද රැක ගැනීමටය. එහි දී ශ්‍රී. ල. නි. පක්ෂයට ඇති වගකීමෙන් එයට මිදිය නොහැකිය. මේ පළල් ජාතික ව්‍යාපාරය ගොඩ නැගීමට උර දීම සියලු දේශප්‍රේමීන්ගේ හා ජාති හිතෛෂීන්ගේ වගකීම හා යුතුකම වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva